නැතිවෙනවා. ඔයා රිලැක්ස් වෙනවා......"ඇය එය නැවත නැවතත් සෙමෙන් උච්චාරණය කළාය. රිදීමාගේ හිසේ සිට දෙපතුළ දක්වා එම විධානය කරගෙන ගියාය.

රිදීමා තම හිස, නළල, මුහුණ වෙත ක්‍රමයෙන් අවධානය යොමු කළාය. ඇයට දැනුණේ සිත ක්‍රමයෙන් සැහැල්ලුවන බවකි. ඝනව තිබූ මාංශ පේශීන් ලිහිල්වනු ඇයට දැනුණේය. අතපය සැහැල්ලුව ගියේය. ගත මුලින්ම අප්‍රාණික විය.

"මම දැන් එකේ ඉඳලා දහයට ගණිනවා. එතන ඉඳන් මම කියනදේට ඇහුම්කන් දීලා මම අහන ප්‍රශ්ණවලට උත්තර දෙන්න....." රිදීමාට, අමාගේ හඬ ඇසුනේ ඉතාම දුරකින් මෙනි. තමා අහසේ පාවෙන වලා කැටියක් මෙන් සැහැල්ලුවටය, ඇයට දැනුණේ. ඇය සිටියේ ඇගේ මහගෙදර මැද සාලයේය. සුපුරුදු ලෙස එහි බිම රතු පැහැයෙන් දිලෙනු ඈ දුටුවාය. බිම පොලිෂ් කළේ, පිංචි කෙල්ලය. සාලයේ දිග සෙටියෙහි හිඳ සිටියේ අම්මාත්, අප්පච්චීත්ය. පසෙක වූ ඇඳි පුටුවක නදින් අය්‍යා උන්නේය. ඔවුහු කුමක්දෝ ගැන වාද කළෝය. අප්පච්චී සිටියේ කෝපයෙනි. අම්මා ශෝකයෙනි. අය්‍යා කල්පනාවෙනි. ඔවුන්ගේ හඬ ඇයට නෑසුණේය.

*ඔහුගේ මුහුණ දහදියෙන් තෙත්ව දිළිසුණේය. ඉරියව් ඉතා නිවැරදිවුත්, මනහරවූත් ඒවා වූයේය. මුව සිනහවකින් විකසිත විය. නැටුමට අනුව, පිටුපසට පීරා ගැට ගසන ලද ඔහුගේ කෙස් කළඹද සෙලවුණේය. කණෙහි වූ කරාබුවද දිලිසිණි.*

දර්ශණය මාරු වූයේ යම් විධානයක් අනුවය.

සුබරත්න මැණිකේ මුළුතැන් ගෙහි වූ රවුම් මේසය මත නැඹුරුව උන්නාය. එහි වූ ලෑල්ලක ඈ අළුවා තුනී කළාය. එහි තුන්හුලස් හැඩයත්, මේසය මත වූ පිටි කැටත් රිදීමා මනාව දුටුවාය. දඟකාර සිනාවක් ඇසිණි. කාගේදෝ අතක් ඉදිරියට ඇදී අළුවා කැබැල්ලක් ඩැහැ ගත්තේය.

"හදලා ඉවරවෙනකල් ඉන්නකෝ සුදු මැණිකේ !" සුබරත්න මැණිකේ නෝක්කඩු කීවාය.

කිකිණි හඬ පැතිරිණි. හීන් රන් වළලු දෙකකින් සැරසුණු ඒ අතම යළිත් අළුවා කැබැල්ලක් සොරාගති. යම් හඬක් ඇසුණෙන්, සුබරත්න මැණිකේ වහා හැරී බැලුවාය. ඇගේ දෑස වෙනස් විය. හැට්ට අතින් නළලෙහි වූ දහඩිය බිඳු පිස දැමූ ඇය මඳ සිනාවක් පෑවාය.

"මේ සුදුමැණිකේගෙන් බේරෙන්න බැහැ......"

දොර අසල වූ යමෙකුට ඈ බයාදු ලෙස පැවසුවාය. දර්ශණය මැකී ගියෝය.

"මේ ළමයට තියෙන විසයක හැටි......."
ඒ අම්මාය. කාගෙදෝ බොකුටු හිසක් ඈ පීරුවාය. එය කපුටු කූඩයක් සේ අවුල්ව තිබුණේය. "මේක මේ හැටි ගැටගහගත්තේ කොහොමද කියල මට නම් තේරෙන්නේ නැහැ....." ඈ පනාව තදින් හිසේ ගැසුවාය.

"ඌයි" ඒ හඬ දඟකාරය.

"අම්මා මට රිදෙනවා......"

"ඉස්කෝලේ ගිය වෙලාවේ ඉඳලා දාංගලේ. වෙන වැඩක් නෑ. පොත පතක් අල්ලනවද කියලා කවුරුත්ම දන්නේ නෑ. නැගිට්ට හැටියේ දුවන්නේ අකුලට......"

අම්මා දිගටම කියාගෙන ගියාය. ඇය පීරූ වරලස දිගු විය. ඈ එහි ගැට හැර, හොඳින් පීරා, සිහින්වට කරල් දෙකක් ගෙතුවාය. ඉන්පසු සුදු රිබන් පටියකින් එය ගැට ගැසුවාය.

"එහෙ, මෙහේ දුවන්නේ නැතිව, හොඳ ළමයා වගේ සපත්තු දාගෙන, මම එනකල් නොහෙල්ලී ඔහොමම ඉන්න...... මට ලෑස්ති වෙන්න පරක්කු උණා........"

සුදු මේස් සහ සපත්තු දැමූ දෙකකුල් පුටුවට පහළින් පැද්දුණේය. සුදු ගවොමේ රැළිද, සුදු බඳපටියද, ඊට උඩින් වූ නිල් ඉරි සහිත ටයිපටියද, රිදීමා දුටුවාය. එය සැදූ අතෙහි වූයේ අර හීන් රන් වළලු දෙකය. දර්ශණය බොඳවී ගියේය. බෙර හඬක් ඇසුණේය. ඒ සමගම ඇසුණේ සුපුරුදු සිනා හඬ හා ගෙජ්ජි හඬය.

වේදිකාව වූයේ අඳුරේය. තිරය මෑත්විය. විදුලි පහන් දැල්විණි. සියල්ල ආලෝකමත් වූයේය. පසෙක හිඳ සිටි අයෙකු බට නලාව වැයී ය. පසුබිමින් ඇසුණු මිහිරි සංගීතය උච්ච විය. කළු පැහැ ඇඳුමකින් යටිකය වසාගත් තරුණයා වේදිකාව මධ්‍යයට පැමිණියේ, වැයෙන තනුවට අනුව නැටීමට පටන් ගත්තේය. ඔහුගේ දෑත්, දෙපා, විදුලිය සේ ලෙලදෙනු රිදීමා දුටුවාය.


ඔහුගේ මුහුණ දහදියෙන් තෙත්ව දිළිසුණේය. ඉරියව් ඉතා නිවැරදිවුත්, මනහරවූත් ඒවා වූයේය. මුව සිනහවකින් විකසිත විය. නැටුමට අනුව, පිටුපසට පීරා ගැට ගසන ලද ඔහුගේ කෙස් කළඹද සෙලවුණේය. කණෙහි වූ කරාබුවද දිලිසිණි. තරුණයා නැටුම අහවර කළේ, පිමි කිහිපයක් උඩ පැනලාය.

තත්පරයක් ගතවන තුරු නිශ්ශබ්දතාවක් පැතිර ගියේය.

*ජීවිතයයි, මරණයයි අතර කිසිම ඉඩක්, පරතරයක් නැහැ. ජීවිතය කියන්නේ සුන්දර දෙයක්. මරණය කියන්නේ එපමණම සුන්දර දෙයක්.*

කාගෙදෝ කිකිණි සිනා හඬක් සමග අත්පොළසන් නදක් ඇසිණි. ශාලාව එම හඬින් ගිගුම් දුනි. ඒ මධ්‍යයේම සිනහ හඬද ඉතා පැහැදිලිව රිදීමාට ඇසුණේය.

"ඊ ළඟට සුදුමැණිකේගේ වාරේ......."
කවුදෝ ගෙජ්ජි හඬ නංවමින් වේදිකාව පසුපසට දිව ගියාය. දර්ශණය යළිදු මාරුවිය. සැඩපහර ගලා ගියේය. ගඟ දිය ඉතා බොර පැහැයෙන්



පෙණිනි. ඊට අසු වූ රොඩු බොඩු සියල්ල ගසා ගියේ ඉතා වේගයෙනි. ගඟ කෝපයෙන් හඬනා හඬ රිදීමාගේ ගත සලිත කළේය.

"ජීවිතයයි, මරණයයි අතර කිසිම ඉඩක්, පරතරයක් නැහැ. ජීවිතය කියන්නේ සුන්දර දෙයක්. මරණය කියන්නේ එපමණම සුන්දර දෙයක්. ජීවිතය උණුසුමින් වැළඳ ගන්නවා වගේම මිනිසුන්ට මරණයත් උණුසුමින් වැළඳ ගන්න පුළුවනි......." ඒ ඇසුණේ රිදීමා දන්නා හඬකි.

"මේ වගේ වෙලාවක ඔය වගේ කතා කියන්න හොඳ නැහැ සුදු මැණිකේ !" තරුණ හඬක් පිළිතුරු දුනි.

"ඇයි මම ගහගෙන යයි කියලා බයද ?"

"සුදු මැණිකේ !"

"බයද කියන්න......"

පය පැටලී, ගලක් ලිස්සා වතුරට වැටුණි. තමා ගඟ පහළට ගසාගෙන යනු රිදීමාට දැණුනේය. ඇගේ හදවතට දැණුනේ බියකි. ඈ වැරෙන් යමක් අල්වා ගත්තාය. වතුරේ වේගයට තමා එහා මෙහා ...පෙනු ඇය භීතියෙන් බලා උන්නාය. කෑ ගැසීමට තැත් කළ මුත්, වතුරෙන් පිරී ගිය මුව විවර කිරීමට ඇයට හැකි වූයේ නැත. වතුරට මේ තරම් වේගයෙන් ගලා ගිය හැකිද ? ඇගේ හදවත කවුදෝ විසින් තෙරපන්නාක් බඳු වේදනාවකින් පිරී ගියේය. කණෙහි නැගුණේ මහා ඝෝෂාවකි.

ජල පහර සමඟ පොර බැදීමට තමාට වාරු නැතිවනු දැනුණෙන්, ඈ අවසාන වරටත් කෑගැසීමට උත්සාහ කළාය. "සුදු මැණිකේ...... සුදු මැණිකේ...." කවුදෝ තමා අමතනු ඇයට ඇසුණේය. ඒ සමගම ඈතින් ඇසුණේ වෙනත් හඬකි.

"රිදීමා...... රිදීමා......"

ඇය ඒ හඬ වෙත කන් යොමු කළාය.

"මම ආපහු දහයේ ඉඳන් එකට ගණිනවා. ඔයාගේ ඇස් හෙමින් අරින්න......"

ඒ හඬ ඇයට විධානය කළේය. ක්‍රමයෙන් ජල කඳ බැස ගියේය. තමා පාවෙන්නාක් බඳුවද, ක්‍රමයෙන් මුලින් සිටි ඇඳ මතටම පත්වන්නාක් බඳුවද රිදීමාට දැනුණි.

"රිදීමා......" අමා ඇගේ අතට තට්ටු කළාය.

රිදීමා ඇස් ඇරියේ සෙමිනි. ග්‍රහණයට අසුකරගත නොහැකි දෙයක් අපහසුවෙන් ගන්නාක් මෙනි. ඈ සෙමින් වටපිට බැලුවාය. ඇගේ යෙහෙළියෝ ගල් ගැසී ඇය දෙස බලා උන්නාහ.

ළබන කළාපයට

